# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 48 දරන
# ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූලි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 48 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 23 වන දින]

එල්. ඩී.—ඔ 10/81.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනත සංශෝධනය කිරීම සඳහා ද, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දින යෙහි ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමෙහි කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 48 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයෙහි (ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද) ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය දරමින් සිටි සෑම තැනැත්තකු ම, ඒ තැනැත්තා ඒ ධුරය දරන්නේ—

මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ධුර දරූ ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන්, මේ පනත ආරම්භ වන දිනයේ දී ඒ ධුර දැරීම අවසන් විය යුතු බව.

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ විධිවිධාන ප්‍රකාර ; හෝ

(ආ) ඉහත කී පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ කරන ලද පත්වීමක් ප්‍රකාර

වුව ද, ඉහත කී පනතේ කුමක් සඳහන්ව ඇතත්, මේ පනත ආරම්භ වන දින ඒ ධුරය දැරීම අවසන් විය යුතු ය.

3. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" පදනමෙහි කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයෝ.

3. (1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සත්දෙනකුගෙන් සමන්විත වන්නා වූ (මේ පනතෙහි මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් විසින්, පදනම පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) යම් සාමාජිකයකු විසින්, තම කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

2—ඒ 56756—12,300 (81/06)

(3) ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, කිසිදු හේතුවක් නොදක්වා යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තිය යටතේ නියමයක් කරනු ලබන්නේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ නියමය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින සිට, ඒ සාමාජිකයා ධුරය අත්හළ ලෙස සැලකිය යුතු ය.

(4) සාමාජිකයකු ඒ ධුරයට තමා පත් කරන ලද දින සිට අවුරුදු තුනක කාලයක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ධුරය දරන්නේ ය :

එසේ වුව ද, මිය යන හෝ ඉල්ලා අස්වන නැත හොත් අන්‍යාකාරයකින් ධුරය අත්හරින යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු කලින් ඔහු ධුරය අත්හරින්නේ නම් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(5) රෝගී භාවය, දුබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොටගෙන, ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(6) (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නොවන යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(7) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් අයකු මණ්ඩලයේ සභාපති වශයෙන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි විටෙක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු ඔවුන් අතුරින් තෝරා ගනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සඳහා පස් දෙනකු විය යුතු ය.

(9) මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කාර්ය පරිපාටිය, (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(10) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩු වක් තිබුණේ වුව ද ඒ නොතකා, මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.